# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2014 නොවැම්බර් මස 18 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.48 ට සභාව රැස්විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (සභානායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සිසිර ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඉන්දික බණ්ඩාර
ඉසුර දේවප්‍රිය
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
උදාර රත්නායක
උදේන විජේරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. මරික්කාර්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
එඩ්වඩ් ගුණසේකර
එස්. කුහවරදන්
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කවින්ද හේෂාන් ජයවර්ධන
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කේ.ඩී. අරුණ දීපාල්
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගුණසිරි ජයනාත්
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නලින්ද ජයතිස්ස
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පියල් නිශාන්ත
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මනෝ ගනේෂන්
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොහොමඩ් මුජිබුර් රහුමාන්
මොහොමඩ් ෆයිරුස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
යූ. ජෝර්ජ් පෙරේරා
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වනිගරත්න
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
සුනිල් ජයමිණි
සුනිල් වටගල
සුමිත්ලාල් මැන්දිස්
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු හර්ෂණ සුපුන් රාජකරුණා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
ආනන්ද රංජිත් රූපසිංහ
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
උපාලි ගුණරත්න
කේ.ඩී. ලාල්කාන්ත
කොලන්නගේ වජිර පෙරේරා
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්දන ජයකොඩි
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
මල්ෂා කුමාරණතුංග මැතිනිය
රොජර් සෙනෙවිරත්න
විජිත් ප්‍රියන්ත
හිරුණිකා එරාංජලී ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය

## 01. නිවේදන

*I*

*"2014 සැප්තැම්බර් මස 23 වන දින සභා සම්මත වූ 2014 අංක 04 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014 නොවැම්බර් මස 05 වන දින අනුමැතිය ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී."*

*II*

*"පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සභාපතිවරයා වන මුදල් විෂයය භාර අමාත්‍යවර ගරු ප්‍රසන්න රණතුංග ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන් එම කාරක සභාවේ කටයුතු කර ගෙන යාමට කාර්ය පටිපාටි රීති අංක 98(8) හි විධිවිධාන අනුව පළාත් සභා මන්ත්‍රී හා පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සාමාජික ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමාව නම් කරන බව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් දැනුම් දී ඇති බවත්, එම නම් කිරීම 2014.10.21 වන දින සිට බලපැවැත්වෙන බවත් ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී."*

*III*

*"2014.10.07 දින පැවති පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ මත්ද්‍රව්‍ය උවදුර රටින් තුරන් කිරීමට විධිමත් හා කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස රජයෙන් ඉල්ලා සිටීමේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සුදුසු පියවර ගැනීම සඳහා ජනාධිපති ලේකම් වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

2014.09.23 වන දින පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව සිසිර ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා [කාරක සභාවේ සභාපති] විසින් ඉදිරිපත් කරන ලදී.

අනතුරුව, 2014.11.05 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා. 10.45 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.36 ට යළිත් රැස්විය.***

## 03. පළාත් සභාවේ රැස්වීම I :

රංජිත් සෝමවංශ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2014.09.23 වන දින පැවති පළාත් සභා රැස්වීමේදී හෝ ඉන් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණ ද, ඒ කිසිත් නොතකා, 2014.11.05 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළඹුණු එකඟතාවයද සැලකිල්ලට ගෙන, 2014 දෙසැම්බර් මස 01, 02, 03 හා 04 යන දිනයන් 2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් විය යුතු අතර, 2014 දෙසැම්බර් මස 05 වන දිනය සභා රැස්වීම් නොපැවැත්වෙන දිනයක් විය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය."*

## 04. පළාත් සභාවේ රැස්වීම් II :

රංජිත් සෝමවංශ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 50(5) හි සඳහන් කාල පරාසයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතුය."*

## 05. පළාත් සභාවේ රැස්වීම් III :

රංජිත් සෝමවංශ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින (2014.11.18 දින) විසිර යෑමෙන් අනතුරුව, මෙම සභාව 2014 දෙසැම්බර් මස 01 වන දින පෙ.ව. 9.00 ට රැස්විය යුතුය"*

## 06. පළාත් සභාවේ කටයුතු :

රංජිත් සෝමවංශ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"සභාවේ වැඩ කටයුතු සඳහා අද එනම්, 2014.11.18 දිනය පොදු කටයුතු වෙනුවෙන් වෙන් කළ දිනයක් යැයි සළකා ක්‍රියා කළ යුතුය"*

## 07. වාර්ෂික මුදල් ප්‍රකාශය : 2015 වසර

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"2015 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදුව, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැය කථාවෙන්[1] අනතුරුව විවාදය කල් තබන ලදී.***

## 08. 2015 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය :

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"2015 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාදය කල් තබන ලදී.***

---

[1] 2014.11.18 දින නිල වාර්තාව බලන්න.

## 09. කල් තැබීම :

ගරු සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 12.50 ට, 2014 දෙසැම්බර් මස 01 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.11.18
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අව/18
Minuts 2014.11.18 - Hansard Section